## අවුරුදු 70ක ඇමරිකා එක්සත් ජනපද -ශ්‍රී ලංකා සබඳතා (#USASL70) සැමරීමට වයික්ලිෆ් ගෝර්ඩන් කොළඹට පැමිණේ.

අවුරුදු 70ක ඇමරිකා එක්සත් ජනපද -ශ්‍රී ලංකා සබඳතා (#USASL70) සැමරීමට එක්සත් ජනපද තානාපති කාර්යාලය හා සංවේදනීය ඇමරිකානු ජෑස් සංගීතඥ වයික්ලිෆ් ගෝර්ඩන් හා එක් වන්න.

ඇමරිකානු සංගීත ශෛලියක් වන ජෑස් සංගීත ප්‍රසංග කොළඹ, ගාල්ල හා මාතරදී පැවැත්වීමට කීර්තිමත් සංගීතඥ වයික්ල්ෆ් ගෝර්ඩන් හා ඔහුගේ අන්තර් ජාතික සංගීත කණ්ඩායමම පෙබරවාරි 24 සිට 28 දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ඇත.

නොමිලේ පවත්වන මෙම ප්‍රසංගවලට සහභාගීවී අවුරුදු 70ක ඇමරිකා එක්සත් ජනපද -ශ්‍රී ලංකා සබඳතා (#USASL70) සැමරීමට වයික්ලිෆ් හා එක්වන්න.

2018 පෙබරවාරි 24, කොළඹ

ප.ව. 12.30 කොළඹ කොටුව දුම්රිය ස්ථානය

ප.ව. 5.00 කොළඹ ගාලු මුවදොර පිටිය

ප.ව. 6.30 කොළඹ විහාර මහාදේවි උද්‍යානය

2018 පෙබරවාරි 26, කොළඹ

ප.ව. 12.30 ඕලන්ද රෝහල, ලෝක වෙළඳ මධ්‍යස්ථානය ඉදිරිපිට

ප.ව. 4.00 වෑකන්ද පාර, කොළඹ 2

2018 පෙබරවාරි 27 - ගාල්ල

ප.ව. 5.00 ගාලු කොටුව

සුප්‍රසිද්ධ සංගීතඥයෙක්, සංගීත රචකයෙක් හා සංගීතය මෙහෙයවන්නෙක් වන වයික්ලිෆ්, වින්ටන් මාසේලිස් වාදක සත් කට්ටුවේ සාමාජිකයෙක්ද, ලින්කන් මධ්‍යස්ථානයේ ජෑස් වාද්‍ය වෘන්දයේ ආරම්භක සාමාජිකයෙක්ද වේ. ඔහුගේ "Jazz a la Carte" ප්‍රසංගය ජෑස් ඉතිහාසයේ හොඳම අවස්ථා පහෙන් එකක් ලෙස වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත්පත විසින් නම් කර තිබේ. වර්තමානයේ ඔහු ජොර්ජියා රීජන්ට්ස් විශ්ව විද්‍යාලයේ නේවාසික සංගීතඥයා ලෙස කටයුතු කරයි.